පන්තිය: 12

විෂය: රසායන විද්‍යාව

සතිය: අගෝස්තු 16-22

1.ඒකකය : පරමාණුක ව්‍යුහය

2.ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

- අ.පො.ස. උ.පෙළ රසායන විද්‍යා සම්පත් පොත පිටු අංක 28-42හොඳින් අධ්‍යයනය කරන්න.
- මෙම පාඩමට අදාළව ඊ නැණ පියස , ඊ තාක්ෂලාව වෙබ් සයිට් වලට පිවිස වැඩිදුර හැදෑරීම් කරන්න.
- ඒවායේ ඇතුලත් ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි ඉගෙනුම් ආධාරක

ඊ නැණ පියස

https://www.enenapiyasa.lk/lms/course/view.php?id=548

ඊ තක්ෂලාව

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=789#section-1

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=33899

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=33981

අමතර පොත්: රසායන විද්‍යා සම්පත් පොත (පරමාණුක ව්‍යුහය)

4.ඉගෙනුම් ඵල

- ඉලෙක්ට්‍රෝන වින්‍යාසය පදනම් කොට ආවර්තිතා වගුව ගොඩනගයි.
- ඉලෙක්ට්‍රෝන වින්‍යාසය අනුව මූලද්‍රව්‍ය s, p හා d ගොනු යටතේ වර්ග කරයි.
- ඉලෙක්ට්‍රෝන වින්‍යාසය අනුව 1 සිට 18 කාණ්ඩවලට හා 1 සිට 7 දක්වා ආවර්තවලට අයත් මූලද්‍රව්‍ය හඳුනා ගනියි.
- නිවාරක ආවරණය සහ සඵල න්‍යෂ්ටික ආරෝපණය විස්තර කරයි.
- සහසංයුජ අරය, වැන්ඩවාල් අරය සහ ලෝහක අරය යොදා ගනිමින් පරමාණුවක අරය විස්තර කරයි.
- කැටායනයක සහ ඇනායනයක අරය එහි පරමාණුක අරය සමග සන්සන්දනය කරයි.
- s හා p ගොනුවල මූලද්‍රව්‍ය ආවර්තයක් දිගේ හරහට හා කාණ්ඩයක් දිගේ පහළට පෙන්නුම් කරන නැඹුරුතා විස්තර කරයි. (පරමාණුක අරය, විද්‍යුත්-සෘණතාව, ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ ශක්තිය වෙනස (E,eg), ප්‍රථම අයනීකරණ ශක්තිය, කැටායන හා ඇනායන සෑදීමේ නැඹුරුතාව)
- මූලද්‍රව්‍යවල ඉලෙක්ට්‍රෝන වින්‍යාස පදනම් කර ගනිමින් පළමු අයනීකරණ ශක්තියේ අක්-වක් විචලනය පැහැදිලි කරයි.
- ඉලෙක්ට්‍රෝන බන්ධුතා ශක්තිය සඳහන් කරයි.
- ආවර්තයක් දිගේ හරහට සහ කාණ්ඩයක් දිගේ පහලට ඉලෙක්ට්‍රෝන බන්ධුතා ශක්තිය විචලනය වන අයුරු විස්තර කරයි.
- පෝලිං පරිමාණය අනුව මූලද්‍රව්‍යයක විද්‍යුත් සෘණතාව විස්තර කරයි.